ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය
டிஜிட்டல் பொருளாதார அமைச்சு
MINISTRY OF DIGITAL ECONOMY

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
ஆட்களைப் பதிவு செய்யும் திணைக்களம்
DEPARTMENT FOR REGISTRATION OF PERSONS

10 වන මහල, සුහුරුපාය, ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල.
10 ஆம் மாடி,சுஹுருபாய, ஸ்ரீ சுபூதிபுர வீதி, பத்தரமுல்லை.
10th Floor, Suhurupaya, Sri Subhuthipura rd, Battaramulla.

මගේ අංකය / எனது இல. / My Ref. DRP/OP/MEDIA /01

ඔබේ අංකය / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2026.04.

"විශ්වසනීය පුද්ගල අනන්‍යතාව හැඳුනුම්පතයි" "அடையாள அட்டை - நம்பகத்தன்மையான தனிநபர் அடையாளம்" "Identity Card, the Trusted Personal Identity"

# මහජනතාව වෙත කරනු ලබන කාරුණික නිවේදනයයි.

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ක්ෂණික දුරකථන අංකය වන 115226126 භාවිතා කර +94115226126, +0115226126 යන දුරකථන අංක මඟින් හා 0771167739, 0742756098 යන ජංගම දුරකථන අංක මඟින් දෙපාර්තමේන්තු නාමය අවභාවිතා කර මේ වන විටත් කිසියම් පාර්ශවයක් විසින් පුද්ගලයන්ගේ පෞද්ගලික තොරතුරු ලබා ගන්නා බවට හා මූල්‍යමය වංචා සිදුකරන බවට අප වෙත වාර්තා වී ඇත.

එම පාර්ශවය විසින් රාජ්‍ය ලාංඡනය යොදා ගනිමින් ජංගම දුරකථන යෙදවුමක් (APP) නිර්මාණය කර ඩිජිටල් හැඳුනුම්පතක් හෝ ඊ ජාතික හැඳුනුම්පතක් සඳහා ඔබගේ තොරතුරු ලියාපදිංචි කර ගන්නා බව පවසමින්, දෙපාර්තමේන්තු නාමය අවභාවිතා කරන බවට අප වෙත තොරතුරු ලැබී ඇත. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව එවැනි ලියාපදිංචියක් සිදු නොකරන බව ඔබ වෙත අවධාරණය කරන අතර, එවැනි ජංගම දුරකථන මගින් ලැබෙන ඇමතුම් සඳහා ඔබගේ තොරතුරු ලබා නොදෙන ලෙස කාරුණිකව දන්වමි.

තවද, අපගේ ක්ෂණික දුරකථන අංකය හා සමාන අංකයකින් ඇමතුම් ලබාගෙන https://drpgov-lk.com යනුවෙන් දෙපාර්තමේන්තු වෙබ් අඩවිය හා සමාන ව්‍යාජ වෙබ් අඩවියක් භාවිතා කරමින් ඔබගේ තොරතුරු ඉල්ලා සිටින්නේ නම් එම තොරතුරු ලබා දීමෙන් වලකින ලෙසත් වැඩිදුරටත් දන්වමි.

පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් ඊ ජාතික හැඳුනුම්පතක් හෝ ඩිජිටල් හැඳුනුම්පතක් සඳහා මේ වන තෙක් කිසිදු ලියාපදිංචියක් සිදු

නොකරන බව දන්වන අතර වංචනික පුද්ගලයින්ගෙන් ආරක්ෂා වන ලෙස මහජනතාව වෙත කාරුණිකව දන්වනු ලැබේ.

එච්.එම්.ජේ.එම්.හේරත්
පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්